# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (සැප්තැම්බර්-2 සතිය)

## 12 තේමාව - මිනිස් හැසිරීම්

දුවේ පුතේ මෙන්න ඔයාලට මේ සතියේ කරන්න හොඳ පැවරුමක්.

01. පහත දැක්වෙන වගුවම ප්‍රයෝජනයට ගත්තාට කමක් නැහැ. ඕනම නම් තව එකක් ඇඳගන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | සමාවෙන්න මට වැරදීමක් වුණේ. | | | | | | | |
| 2 | මට උදවු කළාට ස්තූතියි. | | | | | | | |
| 3 | සුබ උදෑසනක් වේවා. | | | | | | | |
| 4 | ඔයා කරපු දේ හරි හොඳයි. | | | | | | | |

- ඔබ ගෙදර ඉන්න කොට දන්නේම නැතිව ඔබෙන් වැරදි වෙන්න පුළුවන්. එතකොට ඔබ සමාව ගන්න. සමාව ගත්තා නම් ඒ තීරයේ කොටුව තුළ රතුපාට තරුවක් අඳින්න.

- අම්මා හරි ගෙදර කවුරුහරි ඔබට උදවු කළොත් ස්තූති කරන්න. අදාළ තීරයේ කොටුවක රතු තරුව අඳින්න.

- සෑම දිනකම උදෑසන අවදි වූ පසු නිවසේ සිටින අයට සුභ උදෑසනක් වේවා කියන්න. ඔබට අදාළ කොටුවට රතු තරුවක් අඳින්න.

- කවුරු හරි හොඳ වැඩක් කරපුහාම ඔබ කළ දේ හරි හොඳයි කියා පවසන්න. එයද ඔබේ අදාළ කොටුවේ රතු තරුවක් අඳින්න.

❖ ඔබ එසේ කියනවිට ඒ අයගේ මුහුණ දෙස බලන්න.
මුහුණුවල සතුටු පෙනුමක් ඇතිවුණාද?

- ඔබට සතුටක් දැනුණාද?
- හැමදාම එසේ කරන්න.